**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2018**

-------------------------------------------------------------

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 හා 2018 වර්ෂ සඳහා වූ ලෙජර ගිණුම්, මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2019 සැප්තැම්බර් 30 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

-----------------------------------------------------

මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ලෙජර ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

----------------------------------

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 2,231,172,049 |
| ජංගම වත්කම් | 686,456,256 |
| මුළු වත්කම් | 2,917,628,305 |

**බැරකම්**

**---------**

| | |
|---|---|
| ජංගම බැරකම් | 2,532,160,239 |
| ජංගම නොවන බැරකම් | 725,608,431 |
| මුළු බැරකම් | 3,257,768,670 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (340,140,366) |
| මුළු බැරකම් | 2,917,628,305 |
| මුළු ආදයම | 571,650,747 |
| මුළු වියදම | (1,135,549,881) |
| ඌනතාවය | (563,899,134) |

## 2.4 නිතී රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකුල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 8.2.1ඡේදය | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පත්වීම් ලිපි ලබා දිය යුත්තේ පත්වීම් බළධරයා විසින් වුවත්, ස්ථිර පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 27දෙනෙකු බඳවා ගෙන එම නිළධාරීන් වෙත සාමාන්‍යාධිකාරිවරයා හා විධායක අධ්‍යක්ෂක විසින් පත්වීම් ලිපි නිකුත් කර තිබුණි. | මෙම ආයතනයේ එකී කාල සීමාව තුල පූර්ණ කාලීන සභාපතිවරයෙකු සේවයේ නොසිටි බැවින් ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙනයාමේ අරමුණ ඇතිව පරිපාලන, ඉඩම් සහ වැවිලි ලෙස අභ්‍යන්තර අංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වූ අතර එසේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද අනුමැතිය මත සාමාන්‍යාධිකාරී හා විධායක අධ්‍යක්ෂවරයා විසින් සේවා අවශ්‍යතාවය මත එකී පත්වීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කර ඇත. | පත්වීම් බලධාරියා විසින් පත්වීම් ප්‍රධානය කල යුතු වීම . |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 371 (II) ඇ | අත්තිකාරමක් ලබාගත් කාර්යය නිම වූ විගස එම මුදල පියවීමට කටයුතු කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 62 කදී නිලධාරීන් 24 දෙනෙකු විසින් ලබා ගත් රු.1,486,350ක අත්තිකාරම් පියවීමට මාස දෙක සිට මාස දොළහ දක්වා ප්‍රමාද කර තිබුණි. | පිළිගනිමි. මේ සඳහා මුදල් රෙගුලාසි වලට අණුරූපිව කටයුතු කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛයක් 2018 අගොස්තු 09 දින නිකුත් කර ඒ අනුව කටයුතු කරමින් පවති. | ලබාගත් කාර්යය නිම කල විගස අත්තිකාරම් පියවිය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 පෙබරවාරි 03දිනැති අංක එස්පී/ආර්ඩී/02/ 10 ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 3.4 ඡේදය | රජයේ ඉඩම් කළමණාකරණය පිළිබඳ නීති අනුව රාජ්‍ය ව්‍යවසායන් සතු ඉඩම් බදු දීමේදී නීතියෙන් නියම කරනු ලැබූ කාල සීමාවක් ඇත්නම් හැර අනෙකුත් අවස්ථා වලදී එය වර්ෂ 30කට සීමා විය යුතු වුවද, තේ කර්මාන්ත ශාලා 03ක් වර්ෂ 50ක කාලයක් දක්වා බදු දී තිබුණි. | ගුරුක්ඔය හා හරන්ගල කර්මාන්තශාලා 2012,2013 වසර වල එකල පාලනාධිකාරියේ තීරණයක් මත බදු දී ඇත. | රජයේ ඉඩම් කළමණාකරණය පිළිබඳව පනවා ඇති නීති රීති අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන හා ප්‍රවාහන දීමනා හිමිකම් නොමැති නිලධාරීන් 9 දෙනෙකු සඳහා එම දීමනා ලෙස රු.5,444,168 ක මුදලක් ගෙවා තිබුණි. | මණ්ඩලය ස්ථාපිත කල පනතේ විධිවිධාන ප්‍රකාරව අදාල නිළධාරීන් නමදෙනා සඳහා ප්‍රවාහන දීමනා ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.මෙම නිලධාරීන්ගේ පත්වීම් ලිපි වලද එම වරප්‍රසාදය භුක්තිවිදිය හැකි බව සඳහන්ව ඇත. සාමාන්‍යාධිකාරීවරයා රාජකාරී අවශ්‍යතා වෙනුවෙන් දුර බැහැර යායුතු බැවින් එම දුර ප්‍රමාණයන් සලකා ඉන්දන දීමනා ලබා දීමටද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියන් ලබාගෙන ඇත. | මණ්ඩලය දිගින් දිගටම අලාභ ලබන තත්ත්වය මත වියදම් පාලනය කල යුතු වීම සහ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017පෙබරවාරි 28 දින සිට වර්ෂ 20 කාලයක් සඳහා කොළපතන වතුයායේ පිහිටි අක්කර 6 රූඩ් 2 විශාල කලු ගල කැඩිය හැකි ගල් ප්‍රමාණය පිළිබදව පෙර ඇස්තමේන්තුවක් ලබාගෙන මුදල් රෙගුලාසි 686 (ඇ) පරිදි අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයක් මඟින් බදුකරුවකු නිශ්වය කර ගැනීමකින් පසුව මහජන තරගයට ඉදිරිපත් කර බදු දිය යුතු වුවත්, එසේ නොමැතිව ඉඩමේ වටිනාකම සඳහා එකවර ගෙවූ රු.මි 20.24 ක මුදලකට බදු දී තිබුණි. | කැනීම් කළ හැකි ගල් ප්‍රමාණය සම්බන්ධයෙන් (GSMB) භූ විද්‍යා පතල් කැනීම් හා පර්යේෂණ ආයතනයෙන් තක්සේරුවක් නොමැති අතර, පුද්ගලික තක්සේරු වාර්තාවක් මත පදනම්ව එකල සිටි පාලනාධිකාරිය විසින් ලබා දී ඇත. ටෙන්ඩර් කිරීමකින් තොරව කොන්ත්‍රාතුව ලබා දී ඇති බව පිළිගනිමි. | නියමිත පරිදි ඇස්තමේන්තු සකස් කර නියමිත පරිදි මුදල් අයකිරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහත (අ) හි සඳහන් කලුගල වර්ෂ 20 කට පමණ පෙර සිට මේ දක්වාම විවිධ පුද්ගලයින් විසින් අනවසරයෙන් කඩමින් පැවතියද, ඒ සඳහා නිතීමය පියවර ගෙන අලාභ අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | කැනීම් කළ හැකි ගල් ප්‍රමාණය සම්බන්ධයෙන් (GSMB) භූ විද්‍යා පතල් කැනීම් හා පර්යේෂණ ආයතනයෙන් තක්සේරුවක් නොමැති අතර, පුද්ගලික තක්සේරු වාර්තාවක් මත පදනම්ව එකල සිටි පාලනාධිකාරිය විසින් ලබා දී ඇත. ටෙන්ඩර් කිරීමකින් තොරව කොන්ත්‍රාතුව ලබා දී ඇති බව පිළිගනිමි | අනවසර පුද්ගලයින් සඳහා නිතිමය පියවර ගෙන අදාල අලාභයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ඉඩම් පිළිබද වාර්තා අනුව අනවසර පුද්ගලයින් අත්පත්කරගෙන ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 313 ක් ලෙස සඳහන් වුවද, විගණනය අනාවරණය කරගනු ලැබූ තොරතුරු අනුව පුද්ගලයින් 893 දෙනෙකු විසින් ඉඩම් අක්කර 861ක් වසර 10කට වඩා වැඩි කාලයක සිට අනවසරයෙන් අත්පත්කර තිබුනද, ඊට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හෝ බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි.කුමාරවත්ත හා හන්තාන යන වතු යායන්හි සිටින අනවසර පදිංචිකරුවන් ගෙන් 50 ස් දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් සඳහා ඉවත් කිරීමේ දැන්වීම් යවා ඇත. කෙසේ වෙතත් මෙම කටයුතු වලදී දැරීමට වන මුල්‍යා පිරිවැය වැඩිවීම හේතුවෙන් මෙම කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක නොවේ. | මණ්ඩලය සතු ඉඩම් අනවරයෙන් අත්පත් කර ගැනීම පිළිබඳව කඩිනමින් කටයුතු කල යුතු වීම. |
| (ඈ) | ගිවිසුගත කොන්දේසි අනුව තේ දළු අලෙවිකිරීමේදී තේ කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කරන ලද මිල හෝ ඊට ඉහල මිලක් තීරණය කල යුතු වුවද, මහවිල කර්මාන්තශාලාවේ දළු තේ අලෙවි කිරීමේදී බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම්වලට එළඹීමේදී තේ කොමසාරිස් ප්‍රකාශයට පත් කල මිලට වඩා අඩු මිලක් නියම කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මි 3.75ක ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි. | එකඟ විය නොහැක. 2014 වසරේ මණ්ඩලයේ පාලනාධිකාරිය විසින් අමු දළු ඉන්සයිට් පුද්ගලික සමාගම වෙත ලබාදේ. එම ගිවිසුමට අනුව මණ්ඩලය දළු ලබාදීම සිදුකරන ලද අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රකාශිත මිල හා අපවෙත එම සමාගම ගෙවූ මිල සංසන්දනය කිරීමේදී මෙවැනි ආදායම් අහිමිවීමක් දක්නට නොලැබුණි. | ගිවිසුම්ගත මිල ගණන් අනුව තේ දළු අලෙවි කල යුතු වීම. |
| (ඉ) | මණ්ඩලය අයත් මට්ටක්කුලිය ප්‍රදේශයේ ස්ථාන දෙකක පිහිටි එකතුව හෙක්ටයාර් 0.707 ක ඉඩම් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2012, 2013 හා 2015 යන වර්ෂයන්හිදී විකුණා තිබූ අතර, ඒ සඳහා එම ආයතනයෙන් අයවිය යුතු රු.මි 101.03 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මට්ටක්කුලිය ප්‍රදේශයේම මණ්ඩලයට අයත් හෙක්ටයාර් 05 ක ඉඩම් වන්දි මුදලක් තීරණය කර ගැනීමකින් තොරව නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. | ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතනයට මෙම ඉඩම පවරා දී ඇති අතර, මෙහි වන්දි මුදල් ලබා ගැනීම සඳහා අවශ්‍යා ලිපි ගොනු එම ආයතනයට ඉදිරිපත් කර ඇත. මෙතෙක් සතුටුදායක ප්‍රතිචාරයක් ලැබී නොමැත. කෙසේ වෙතත් මෙය අයකර ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | මුදල් අය කිරීමකින් පසුව පමණක් ඉඩම් විකිණීම සිදු කල යුතු වීම හා වෙනත් පාර්ශවයන් වෙත ඉඩම් පැවරීමට පෙර ඒ සඳහා වන්දි මුදල් අයකර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 1995 සැප්තැම්බර් 21 දිනැති අංක SAI/A/4/34 දරණ ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන වාර්ෂික බදු මුදල තීරණය කල යුතු අතර සෑම වසර පහකට වරක් එම බදු මුදල සියයට මුදල් 50කින් වැඩිවන ලෙස බදු ගණනය කල යුතුය. නමුත් මණ්ඩලය විසින් 2001 වර්ෂයේදී බදුදුන් හන්තාන වතුයායට අයත් අක්කර 01 පර්චස් 1.3 ක කර්මාන්තශාලාව හා 1986 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා බදුදුන් තවත් වතු 03 කට අයත් ඉඩම් හෙක්ටයාර් 64.55ක් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණු අතර, සමාන බදු මුදලක් අයකිරීම හේතුවෙන්, මණ්ඩලයට අයකර ගත හැකිව තිබූ රු.මි. 32.24ක ආදායමක් අහිමි වී තිබුණි. | එකඟ විය නොහැක. වසර පහකට වරක් 50% බදු වැඩි කිරීමට අත්සන් කර ඇති බදු ගිවිසුම් තුල කොන්දේසි ඇතුලත් වී නොමැති හෙයින් රජයේ තක්සේරුව හා 50% ක බදු වැඩිවීමට අනුව බදු මුදල් සංශෝධනය කිරීමට නොහැකි තත්වයක් මතුවී ඇත.ඒ ඒ අවධි වල සිටි පාලනාධිකාරිය විසින් ගිවිසුම් වලට එළඹී ඇත. මෙම ගැටලුව නිරාකරනය කැරගැනීමට නීතිපති උපදෙස් විමසා ඇති අතර, ලැබීමට නියමිත පිළිතුරු අනුව ඉදිරි ගිවිසුම් සඳහා ක්‍රියාත්මක වීමට කටයුතු කිරීමට නියමිතය. | රජයේ ඉඩම් බදු දීමේදී තක්සේරු වාර්තාවක් ලබා ගෙන වසර පහකට වරක් සියයට 50 කින් වැඩි වන ලෙස බදු මුදල තීරණය කළ යුතු වීම. |
| (උ) | මණ්ඩලයට අයත් වතු 09ක හෙක්ටයාර 609 ක ඉඩම් 1986 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල බදු දී තිබූ අතර අදාල ගැණුම්කරුවන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවීමට තිබූ රු.මි. 61.55 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ විය නොහැක. ලැබිය යුතු ශේෂය ගණනය කොට ඇත්තේ 1995 ඉඩම් සම්බන්ධ ජනාධිපති මාර්ගෝපදේශයේ සඳහන් 50% ක බදු වැඩි වීම උපයෝගී කොට ගෙනය. මෙය ගෙවන ලෙස බදු කරුවන්ට දැන්වූවත් ගිවිසුම් කොන්දේසි වලට මෙය බල නොපාන බව සඳහන් කරමින් සමහර බදුකරුවන් මෙය ගෙවා නැත. එමනිසා විමසුමේ සටහන් ප්‍රමාණය ලැබිය යුතු ලෙස ගත නොහැක. | බදු මුදල් අය කිරීමෙන් පසුව පමණක් ඉඩම් බදු දිය යුතු වීම. |
| (ඌ) | අදාල බලධාරීන්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව නිළධාරීන් 24 දෙනෙකු සඳහා වැටුප් වර්ධක 2 සිට 10 දක්වා ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී ලබා දීම හේතුවෙන් රු.594,095 ක අමතර වැටුප් වියදමක් දරා තිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ සේවය කරන ලද සේවකයින් විසින් ඉදිරිපත් කරන ලද දුක්ගැනවිලි විශ්ලේෂණය කිරීමෙන් පසු අමතර වැටුප් වර්ධකයක් හෝ උසස්වීමක් හෝ නොලද සේවකයින් හට දිරිගැන්වීමේ අරමුණින් අමතර වැටුප් වර්ධක 02ක් පිරිනැමීමට කළමනාකාරිත්වය කටයුතු කරන ලද අතර මින් ඉදිරියට එවැනිඅමතර දීමනාවන් ලබා නොදීමට තීරණය කරන ලදී. | වැටුප් වර්ධක ලබා දීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කල යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට මණ්ඩලය විසින් පාලනය කරනු ලබන තේ වතු 15කට හෙක්ටයාර් 10,143 ක භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 3,169 ක තේ සහ අනෙකුත් භෝග සඳහා යොදාගෙන තිබූ අතර ගොඩනැගිලි හැර තේ වගාව සඳහා යොදවා ගැනීමට හැකියාව තිබූ ඉඩම් හෙක්ටයාර 5,829 ක් තේ වගාව සඳහා යොදා ගැනීමට හෝ බදු දීමට කටයුතු කර නොකිරීම හේතුවෙන් එම ඉඩම් නිෂ්කාර්යයව පැවතුණි. | මෙහි හෙක්ටාර් 2971 ක ඉඩම් ප්‍රමාණයක් පෞද්ගලික ව්‍යවසායකයින්ගේ හා මණ්ඩලයේ මැදිහත් වීමෙන් ව්‍යාපෘති ඇති කිරීමට හා බදු දීමට යෝජනා කර ඇතත් ඉහල කළමණාකාරිත්වයේ මාරුවීම මත වෙනස් වී ඇත. නැවත මෙම වසරේ නව සභාපතිතුමා යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. | සියලු ඉඩම් වලින් ආදායම් ඉපයීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | දිගින් දිගටම මණ්ඩලය මගින් නිෂ්පාදනය කරන තේ වල ගුණත්වය වැඩිකිරීමටත්, නිෂ්පාදන පිරිවැය පාලනය කර ගැනීමටත් කළමණාකරණය අපොහොසත් වීම හේතුවෙන් මණ්ඩලය නිෂ්පාදනය කරන තේ කිලෝ එකක දායකය (Contribution per kilogram) ඍණ අගයක් ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද දායකය වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිලිගනිමි. 2017 හා 2018 වර්ෂ වල තේ මිළ පහත වැටීම හා 2018 වසරේ පොහොර භාවිතය සාපේක්ෂව අඩුවීමක් නිසා තේ වල ගුණාත්මක භාවය අඩුවීමක් නිසා තේ සඳහා සාධාරන මිළක් ලබා ගැනීමට නොහැකිව තිබුණි. තවද නිෂ්පාදන පිරිවැයේ ප්‍රධාන සංකේතයක් වන (Labor Wages ) කම්කරු වැටුප් වැඩිවීම මත 2017 නිෂ්පාදන පිරිවැය වැඩිවීම මත ඒකක දායකය ඍණ අගයක් ලබා ඇත. | තේ වල ගුණත්වය වර්ධනය කර ගැනීමට හා නිෂ්පාදන පිරිවැය පාලනය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ඇ) | තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව මැදරට තේ හෙක්ටයාරයකට සාමාන්‍ය කිලෝග්‍රෑම් 1200 ක් වුවත්, මණ්ඩලට අයත් ආයුකාලය ඉක්ම වූ පැරණි වගාවන් ඉවත්කර නව වගාවන් ආරම්භ නොකිරීම, පොහොර අඛණ්ඩව නොයෙදීම හා පාළු අඛණ්ඩව සිටුවීමට කටයුතු නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ වතු 15 ක කිලෝග්‍රෑම් 398 ත් කිලෝග්‍රෑම් 759 ත් අතර පරාසයක පැවතියත් එම නිෂ්පාදනය වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙයට මූල්‍යමය අරමුදල් නොමැත. එසේ තිබියදී 2016 සිට 2018 දක්වා ක්‍රමවත්ව ඵලදායීතාව වැඩි කර ඇත. | සමාන්‍ය ඵලදාව ඉහල නංවා ගැනීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේ අයවැය ලේඛනය පරිදි තේ වගාවට යොදාගත නොහැකි හෙක්ටයාර 959ක පැල තවාන් හා වගා නොකල හිස් ඉඩම් හෙක්ටයාර 1770 ක් හඳුනාගෙන තිබුණද, එම ඉඩම් වගා කටයුතු සඳහා යොදාගැනීමට කළමණාකරනය කටයුතු කර නොතිබුණි | පිළිගනිමි. මෙයට මූල්‍යමය අරමුදල් නොමැත. | මණ්ඩලය සතු භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ පොහොර මිලදී ගැනීම සඳහා රු.මි 87.38 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද මණ්ඩලය , විසින් ඒ සඳහා රු.මි 7.59 ක මුදලක් පමණක් වැය කර තිබීම හේතුවෙන් වගාවේ අවශ්‍යතාවය පරිදි පොහොර නොයෙදීමෙන් තේ අස්වැන්න අඩු වී තිබුණි. | පිළිගනිමි. මෙයට මූල්‍යමය අරමුදල් නොමැත. | සැලසුම් කල පරිදි වගාවට අවශ්‍ය පොහොර ප්‍රමාණය යෙදිය යුතු වීම. |
| (ඊ) | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ඉඩම් ලේඛණය (Hectarage statement) අනුව, රබර් වගාව සඳහා යෙදවිය හැකි ඉඩම් හෙක්ටයාර 2177 ක් වුවත් හෙක්ටයාර 563 ක් පමණක් රබර් වගාකර තිබුණි. | පිළිගනිමි. මෙයට මූල්‍යමය අරමුදල් නොමැත. | සැලසුම් කල භූමිය නියමිත පරිදි උපයෝජනය කල යුතු වීම. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

--------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 33,567 ක් 2011 හා 2017 කාලයේදී වසරකට රු.මි. 22.52 බැගින් බදු දී තිබූ අතර , අදාල බදුකරුවන් ඉවත්ව යාමෙන් පසු නිෂ්කාර්යයව පැවති එම ගොඩනැගිල්ල නැවත බදු නොදීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේදී උපයාගත හැකිව තිබූ රු.මි. 22.52කට වැඩි ආදායමක් අහිමි වී තිබුණි. | ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ගොඩනැගිල්ල කොළඹ නගර සංවර්ධන අධිකාරිය සැලස්මට අනුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගැනීමට නියමිතව තිබූ හෙයින් දිගු කාලීන බදු ගිවිසුම් මත මෙම ගොඩනැගිල්ල නිදහස් කිරීමට හැකියාවක් නොමැත. එමනිසාමෙය බදු කරුවකුට ලබාදීමට නොහැකි විය. | මණ්ඩලය දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයක් යටතේ අදායම් වැඩිකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට දෛනික ධාරිතාවය කිලෝග්‍රෑම් 90,500 ක් වන තේ කර්මාන්තශාලා 09 ක් වර්ෂ 29 ත් 15 ත් අතර කාලයක සිට වසාදැමීම හා තවත් කර්මාන්තශාලා 06ක් බදු දීම නිසා මණ්ඩලයේ පැවති තේ ඉල්ලුම සැපරීමට නොහැකි වීමෙන් බාහිර ගැණුම්කරුවන්ගෙන් රු.මි.131.85ක් වටිනා තේ කිලෝග්‍රෑම් 263,627 ක් වෙන්දේසියෙන් මිලදී ගෙන අලෙවි කිරීමට සිදු වී තිබුණි. | හමුදා සහ සතොස ටෙන්ඩර්වලට යොදා ඇති 1T 1 ප්‍රමිතිය ගලපා ගැනීමට නොහැකි නිසා සහ එම තත්වයන් යටතේ අප ආයතනයේ තේ නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන නිසා පිටස්තර පාර්ෂවයන්ගෙන් තේ මිළදී ගැනීමට සිදු විය. | මණ්ඩලයේ කර්මාන්ත ශාලා සක්‍රීයව පවත්වාගෙන යෑමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේදී රු.මි 4.52 ක් වැය කර අළුත්වැඩියා කර තිබූ හන්තාන උඩුවෙල තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදුකළ හැකි බව ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී තිබියදී එය වසා දැමීමට කළමණාකරනය තීරණය කිරීම හේතුවෙන් කර්මාන්තශාලාවේ පැවති රු.මි. 18.89 ක් වටිනා යන්ත්‍රසූත්‍ර හා කර්මාන්තශාලාව 2016 ජූනි 04 දින සිට නිෂ්කාර්යයව පැවතුණි. | 2016 වසරේ තිබූ අයහපත් කාලගුණික තත්වය මත තාවකාලිකව කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නතර කර ඇති අතර, එවකට පැවති පාලනාධිකාරියේ තීරණ මත සහ එම අවස්ථාවේදී තේ කොමසාරිස් විසින් කර්මාන්තශාලාවෙහි පෙන්වා දුන් අඩුපාඩු මත මෙය වසා තිබුණි. කෙසේ වෙතත් මේ වනවිට නව බදු කරුවකුට කර්මාන්තශාලාව ලබාදී නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | අදාල කර්මාන්ත ශාලාව කඩිනමින් සක්‍රීය කිරීමට කටයුතු කල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 අගෝස්තු 01 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (11) අනුව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්යය මණ්ඩලය තුල නොමැති තනතුරු සඳහා සේවකයින් බඳවාගැනීම නොකල යුතු වුවත් ඊට පටහැනිව ක්‍රියාකරමින් සමාලෝචිත වර්ෂයේදී අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති කළමණාකරු වන, සහකාර ගණකාධිකාරි, මූල්‍ය උපදේශක, පුද්ගලික ලේකම්, නිෂ්පාදක උපදේශක ඇතුළු තනතුරු 17ක් සඳහා නිළධාරීන් 27 දෙනෙකු බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස රු.මි. 10.68 ක් ගෙවා තිබුණි. | ආයතනයේ කටයුතු අඛණ්ඩව කරගෙනයාමේ අවශ්‍යතාවයත් පලපුරුදු නිළධාරීන් ආයතනය තුල නොමැති වීමත් හා ආයතනික කාර්යයන් ප්‍රමාද කල නොහැකි වූ බැවින් කළමනාකාරිත්වය වෙත මෙම ආයතනය ස්ථාපිත කරන ලද අංක 1972 අංක 11 දරණ කෘෂිකාර්මික පණත මගින් ලැබී ඇති බලතල චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන් උල්ලංගණය කිරීමේ අපේක්ෂාවකින් තොරව හුදෙක් ආයතනය පවත්වාගෙනයෑමේ යහපත් චේතනාවෙන් කොන්ත්‍රාත් බඳවාගැනීම් සිදුකර ඇත. තවද මෙම සියලුම බඳවාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව සිදුකරන ලදී. | අනුමත තනතුරු සඳහා පමණක් නිලධාරීන් බඳවා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්‍රාමික නිළධාරියෙකු නැවත සේවයේ යෙදවීමේදී 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය ලබාගත යුතුවුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලොචිත වර්ෂය අවසන් වන විට වයස අවුරුදු 60 ඉක්මවූ ස්ථිර හා අනියම් නිලධාරීන් 20 දෙනෙකු සේවය කර තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු.මි.16.13 ක වැටුප් පිරිවැයක් දරා තිබුණි. | වතු සේවකයින් සේවා අවශ්‍යතාවයන් මත කොන්ත්‍රාත් පදනම මත හා සේවය දීර්ඝ කොට ඇති අතර 2019 අප්‍රේල් 30 දින ක්‍රියාත්මක වන පරදී සියලුම සේවකයින්ගේ වැඩ අවසන් කොට ඇත. | වයස අවුරුදු 60 ඉක්මවූ නිලදාරීන් සේවා දිගුවක් ලබා දීම හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම නොකල යුතු වීම. |
| (ඇ) | 2011 අගෝස්තු 03 දිනැති කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වන කළමණාකරු- මානව සම්පත් හා කළමණාකරු - නීති යන තනතුරු සඳහා MM 1-1 වැටුප් බාණ්ඩය අනුමත කර තිබියදී, මණ්ඩලය විසින් අදාල තනතුරු සඳහා නිළධාරීන් දෙදෙනෙකු බඳවාගෙන HM 1-1 වැටුප් බාණ්ඩයේ පිහිටුවීම හේතුවෙන් 2017 අප්‍රේල් සිට 2019 අගෝස්තු දක්වා රු.මි. 3.58 ක අමතර වැටුප් වියදමක් මණ්ඩලය දරා තිබුණි. | සේවය සඳහා කළමනාකරු - මානව සම්පත් හා කළමනාකරු - නීති මෙම ආයතනයට බඳවාගන්නා අවස්ථාවේ බඳවාගැනීමේ පටිපාටියක් මෙම ආයතනය සඳහා සකස්කර නොතිබිණි. නමුත් ආයතනයට අදාල මානව සම්පත් හා නීතිමය රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහළම ලකුණු ලබාගන්නා ලද අයදුම්කරුවන් ඒ සඳහා බඳවාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ආයතනය කටයුතු කර ඇත. ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්දට අනුව සුදුසු වැටුප්තලයක පිහිටුවීමට කළමනාකාරිත්වය කටයුතු කර ඇත. | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කල වැටුප් බාණ්ඩය යටතේ නිලධාරීන් බඳවා ගත යුතු වීම. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ ගිණුම් අංශයට අනුයුක්තව ගිණුම්කරණ හා මූල්‍ය කළමණාකරු උපදේශකවරයකු, ගණකාධිකාරිවරුන් දෙදෙනෙකු හා නිලධාරීන් 11 දෙනෙකු සේවය කරන අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.මි.10.11 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ නමුත් 2003 ජුනි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි 2017 හා 2018 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ 2019 ඔක්තෝබර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. . | පිළිගනිමි.2018 වසර සඳහා ගිණුම් වාර්තා පිළියෙළ කර ඇති අතර සමහර ගිණුම් වල නිවැරදි කිරීමේ ජර්නල් සටහන් ඇතුලත් කලයුතු බැවින් හැකි ඉක්මනින් ඒවා පිළියෙළ කර අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමට නියමිතය.2017 අවසන් ගිණුම් සකස් කොට ඇති අතර එහි නිවැරදිතාව තහවුරු කර ගැනීම සඳහා පුද්ගලික විගණන ආයතනයකට ලබාදී ඇති අතර මෙය ලැබුණු පසු විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. | මූල්‍ය වර්ෂය තුල මූල්‍ය ප්‍රකාශන කඩිනමින් විගණනයට ඉදිරිපත් කල යුතු වීම. |

**4.2 විගණන හා කළමණාකරන කමිටු පැවැත්වීම**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | පිළිගනිමි. 2018 වසරේ අවසන් කාර්තුවේ රටේ පැවති දේශපාලන අස්ථාවරභාවය නිසා අධ්‍යක්ෂක මණ්ඩල වෙනස් වීම් හේතුවෙන් විගණන කමිටු පැවැත්වීමට නොහැකි වූ බව දැනුම් දෙමි.තවද 2017 වසරේ කමිටු රැස්වීම් 4 ක්ද 2019 වසරේ මේ වන විට කමිටු රැස්වීම් 03ක් ද පවත්වා ඇත. | අභ්‍යන්තර පාලනය සහ යහ පාලන අරමුණු ශක්තිමත් කර ගැනීම සඳහා ආල කමිටු රැස්වීම් නියමිත කාල කාල වාකවානු තුල පවත්වාගෙන යාම. |